වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2022

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

கடன் இணக்க சபைத் திணைக்களம்

DEPARTMENT OF DEBT CONCILIATION BOARD

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 231

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරංශය

1.1 හැඳින්වීම

ඉඩකඩම්, කුඹුරු, වතුපිටි නිවාස නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණයගැතිවී ඇති මහජනතාව එම ණයගැතිභාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියා මාර්ගයක් හඳුන්වාදීම අරමුණ කරගෙන 1941 අංක 39 දරණ සහනදායක ආඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මීට අමතරව 1999 දී කරන ලද අංක 29 දරණ සංශෝධන පනතට අනුව හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වී සහන සැලැස්වීමට හැකිවීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත. මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මඟින් මුදල් හිමියන් විසින් අත්තනෝමතික ලෙස ණය ගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි. මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද එමඟින් ණයහිමියන්ටද අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපල පිළිබඳව ණයකරුට පහසුවන්නා වූත් ණයහිමි පිළිගන්නුවූත් කොන්දේසි මත එම දේපල බේරා ගැනීමට උපකාර කිරීම මෙම මණ්ඩලයේ පරමාර්ථයයි. මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර, මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටු කරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලත් බැවින් ණය බරින් මිරිකි සිටින ජනතාවට මෙමඟින් ලැබී ඇති සේවය අති විශාලය. එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතිඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය.

2019 අංක 04 දරණ ණය සහනදායක (සංශෝධිත) පනත අනුව ණය සහනදායක මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වන අතර, මණ්ඩලයේ සභාපතිවරයා මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයෙකු ලෙස විනිශ්චයකාර ධූරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තෙකු හෝ, නීතීඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වන්නා වූ වෘත්තීය අත්දැකීම් සහිත තැනැත්තෙකු විය යුතුය.

මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් දසදෙනා -

- නීතිඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තිය පළපුරුද්ද සහිත හෝ,
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීප ව්‍යාප්ත සේවකයක I වන ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තන් විය යුතුය
- වාණිජ ක්ෂේත්‍රයේ පලපුරුදු අයෙකු

අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබීය හැකි පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා හතරදෙනෙකු නොඉක්මවන්නා වූ හා දෙදෙනෙකුට නොඅඩු වන්නා වූ වෙනත් සාමාජියන් සංඛ්‍යාවකින් සෑම ශාඛා මණ්ඩලයක්ම සමන්විය විය යුතුය.

- සෑම ශාඛා මණ්ඩලයකම සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතු අතර, මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයෙකු ලෙස විනිශ්චයකාර ධූරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තකු හෝ
- නීතිඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තිය අත්දැකීම් සහිත තැනැත්තෙකු විය යුතුය.

සෑම ශාඛා මණ්ඩලයකම අනෙකුත් සාමාජිකයන්

- නීතිඥවරයෙකු ලෙස අවුරුදු දහයකට නොඅඩු වෘත්තිය අත්දැකීම් සහිත හෝ,
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක I ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරන හෝ දරා ඇති තැනැත්තන්ගෙන් සමන්විත යුතුය.

මෙම මණ්ඩලයේ රාජකාරි කටයුතු සාමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය විසින් ඉදිරියේ එළැඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළැඹෙන ගිවිසුම් මිස මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවේ. එසේ වුවද අසාධාරණ පොළී ප්‍රමාණයන් අඩු කිරීමටද මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණයකරුවන්ට සහතිකයක් නිකුත් කිරීමටද මණ්ඩලයට බලතල ඇත. එසේම ණයහිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කළ නොහීසීය පරිදි විභාගයට නොපැමිණියහොත් ඒකපාර්ශවික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කෙරේ. එහෙත් එසේ කරනු ලබන්නේ ලියාපදිංචි තැපෑලෙන් හා ග්‍රාම නිලධාරි තැන මඟින් අවස්ථානෝචිත පරිදි ණයහිමි වෙත දැනුම්දී ණයහිමි පාර්ශවය හිතාමතාම විභාගයට පැමිණීම පැහැර හරින්නේ යැයි මණ්ඩලයට නිශ්චිත ලෙස ඒත්තු ගියහොත් පමණි. මෙබඳු අවස්ථාවකදි එවැනි සහතිකයක් නිකුත් කිරීමෙන් ඇතිවන වාසිය ණයකරු සතු වේ. වෙනත් අධිකරණයක් මේ පිළිබඳව විභාගයක් පැවත්වෙන අවස්ථාවකදි මෙම සහතිකය එම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් ණය මුදල බේරුම් කිරීම සඳහා වසර 10 ක උපරිමයකට යටත්ව කාල සීමාවක් ලබාදීමටත් පොළිය අවම අනුපාතය දක්වා අඩුකිරීමටත් නඩු ගාස්තු කිසිවක් ණයකරුගෙන් අයකර නොගැනීමටත් ණය සහනදායක ආඥාපනත යටතේ අධිකරණයට බලතල ලබාදී ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

මෙහෙවර

උකස්කරයක්, පොරොන්දු සින්නක්කරයක් හෝ හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පු සම්බන්ධව ගත් මුදලක් ඇපයට බැඳී ඇති කෘෂිකාර්මික හෝ ගේ දොර, ඉඩකඩම් ආදී වූ නිශ්චල දේපලක් ණය සහනදායී අන්දමට වාරික මඟින් හා අඩු පොළි අනුපාතයට ගෙවා නිදහස් කරගැනීමට ණයකරුවන්ට අවශ්‍ය නීතිමය රැකවරණය හා සහන සලස්වා දීම

දැක්ම

නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ ණය ගණුදෙනුවලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩපිළිවෙළක් සලසාදීම.

අරමුණු

නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර පොරොන්දු සිනක්කරයක් හා හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි අය විය යුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

ඉඩකඩම්, කුඹුරු, වතුපිටි, නිවාස වැනි නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණය ගැතිවී මහජනතාව එම ණයගැතිභාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායී ක්‍රියාමාර්ගයක් හඳුන්වාදීම අරමුණු කරගෙන 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මීට අමතරව 1999 දී කරන ලද අංක 29 දරණ සංශෝධන පනතට අනුව හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වී සහන සැලැස්වීමට හැකිවීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත. මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මඟින් මුදල් හිමියන් විසින් අත්තනෝමතික ලෙස ණයගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි. මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද එමඟින් ණයහිමියන්ට අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපළ පිළිබඳ ණයකරුට පහසුවන්නාවූත් ණයහිමි පිළිගනු ලබන්නාවූත් කොන්දේසි මත එම දේපළ බේරා ගැනීමට උපකාර කිරීමට මෙම මණ්ඩලයේ පරමාර්ථයයි.

මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටුකරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් බැවින් ණය බරින් මිරිකී සිටින ජනතාව මෙමඟින් ලැබී ඇති සේවය

අති විශාලය. තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතීඥයන් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් මහජනතාව සිදුවන සේවය ඉමහත්ය.

1.4 සංවිධාන සටහන



02 පරිච්ඡේදය- ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2022.01.01 සිට 2022.12.31 දක්වා ණය සහනදායක මණ්ඩලයේ කාර්ය සාධනය

විස්තරය	සංඛ්‍යාව
2022.01.01 දිනට ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව	**1424**
නව ඉල්ලුම්පත් සංඛ්‍යාව	455
සමාලෝචනය සඳහා හා නිෂ්ප්‍රභා ඉල්ලීම් සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව	17
මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව	**1896**
සමථයට පත්කල ඉල්ලුම්පත් සංඛ්‍යාව	417
නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	226
සමාලෝචනය කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	30
සහතික නිකුත් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	03
ඉල්ලා අස්කරගත් ඉල්ලුම්පත් සංඛ්‍යාව	67
රෝලෙන් ඉවත් කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	22
පසෙක තබන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	72
පියවර ගත් මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව	**837**
2022.12.31 දිනට අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව	**1115**

- 2022 වර්ෂයේදී අවසන් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව මුළු අයදුම්පත් සංඛ්‍යාවෙන් 44% ක ප්‍රතිශතයකි.
- ගාල්ල ශාඛාවේ සමථ වූ මුත් නැවත මුදල් ගෙවීම සඳහා කැදවන නඩු - 53 කි.

2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා

දිස්ත්‍රික්කය	**2022.12.31 දිනට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව**
කොළඹ	71
කළුතර	50
කුරුණෑගල	52
කෑගල්ල	16
රත්නපුර	17
බදුල්ල	03
අම්පාර	01
ගාල්ල	61
මාතර	19
හම්බන්තොට	06
ගම්පහ	129
මහනුවර	15
පුත්තලම	09
මාතලේ	06
	455

ශාඛා මණ්ඩලය	**2022.01.01.** ශාඛා සතුව පවතින ඉල්ලුම්පත් සංඛ්‍යාව	**2022.12.31** දිනට අවසන් කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	**2022.12.31** දිනට ඉතිරි වී ඇති නඩු සංඛ්‍යාව
ප්‍රධාන මණ්ඩලය	499	307	170
කොළඹ ශාඛා මණ්ඩලය	(නොවැම්බර් 28 දින සිට) 181	04	183
ගාල්ල ශාඛා මණ්ඩලය	266	160	188
ගම්පහ ශාඛා මණ්ඩලය	481	197	278
කුරුණෑගල ශාඛා මණ්ඩලය	469	166	296

03. මූල්‍ය ප්‍රගතිය

වැය විෂය	2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන(රු මි.)	2022.12.31 දිනට වියදම (රු මි.)	2022.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (%)
පුනරාවර්තන	39.90	37	92%
ප්‍රාග්ධන වියදම	0.73	0.1	13.6%
එකතුව	40.63	37.9	91%

දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම

ණය සහනදායක මණ්ඩල මේ වන විට කොළඹ 08, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවතෙහි අංක 35 ඒ දරණ ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන අතර දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම පාහේ ණයසහනදායක මණ්ඩලයේ සහනපත්‍ර දෛනිකව කොළඹට පැමිණෙන මහජනතාවගේ පහසුව සඳහා දෛනික ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන්, මහජනතාව වෙත කාර්යක්ෂමව සේවාව සැපයීම සඳහාත්/ ණය සහනදායක මණ්ඩලයේ සේවාව දීප ව්‍යාප්ත කිරීමේ අරමුණින් 2019 අංක 04 දරණ ණය සහනදායක (සංශෝධිත) පනත අනුව ශ්‍රී ලංකා ණය සහනදායක මණ්ඩලය ලෙස පුළුල් කරන ලදි.

ඒ අනුව, ණය සහනදායක මණ්ඩලය සඳහා දෛනිකව ලැබෙන අයදුම්පත් අනුව වැඩි වශයෙන් අයදුම්පත් ඉදිරිපත් වන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගනිමින් ගාල්ල , කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ශාඛා මණ්ඩල පිහිටුවන ලදි. තවද උතුර, උතුරු මැද, වයඹ සහ මධ්‍යම පළාත් ද ආවරණය වන ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ශාඛා මණ්ඩලයක් ද පිහිටුවා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ණය සහනදායක මණ්ඩලයේ සේවාව ඉතා කාර්යක්ෂම සහ ඵලදායී අයුරින් මහජනතාව වෙත ලබාදීමට බලාපොරොත්තු වෙමු.

03 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒඕඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඕඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		45,612,000	28,654,700.00	ඒඕඒ-3
-	තැන්පතු		86,486	46,091.00	ඒඕඒ-4
-	අත්තිකාරම් ගිණුම්		1,640,697	963,993.00	ඒඕඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		47,339,183	29,664,784.00	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		47,339,183	29,664,784.00	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		8,741	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		47,330,442	29,664,784.00	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
23,740,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	21,642,644	10,881,263.00	

16,075,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	15,237,069	12,875,398.00	ඒසිඒ-2(ii)
85,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	32,179	40,751.00	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
39,900,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**36,911,892**	23,797,412.00	
	මූලධන වියදම්				
225,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	66,800.00	
480,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	89,990	5,760,219.00	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
25,000.00	හැකියා වර්ධනය	14	11,000	90,500.00	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
730,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**100,990**	5,917,519.00	
	තැන්පතු ගෙවීම්		86,486	46,091.00	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		1,885,583	686,270.00	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**1,972,069**	732,361.00	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		38,984,950	30,447,292.00	
40,630,000.00	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		8,345,491	(782,508.00)	
	අඟුම් සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		8,345,491	(782,508.00)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අඟුම් ශේෂය		-	-	ඒසිඒ-3

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්සා 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	11,012,649	10,972,059
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	2,497,620	2,252,733
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**13,510,269**	**13,224,792**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		2,497,620	2,252,733
දේපළ පිරියත හා උපකරණ සංචිතය		11,012,649	10,972,059
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අදාළ ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**13,510,269**	**13,224,792**

පිටු අංක 08 සිට 26 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ සටහන් පිටු අංක 27 සිට 33 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්හිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුම්හි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : වසන්තා පෙරේරා.
තනතුර :ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
දිනය :

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

D. S. Dayananda.
.....
ගණන්දීමේ නිලධාරි
නම : සුභාෂිණි දයානන්ද
තනතුර : ලේකම්, ණයසහනදායක මණ්ඩලයිසුභාෂිණිදයානන්ද
දිනය :

ලේකම්
ණය සහනදායක මණ්ඩලය
අංක 35 වී, ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08.
23.02.2023

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : පී. එන්. විජේගුණරත්න
දිනය : 2023/02/23

P.N. Vijegunaratne
Accountant (Acting.)
Department of Debt Conciliation Board
No. 35A, Dr. N.M. Perera Mawatha,
Colombo 08.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2022 රු.	**2021** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිහාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,059,159	599,790
අග්‍රිම ලැබීම්	45,612,000	28,654,700
අත්තිකාරම් අයකර ගැනීම්	1,724,537	764,993
තැන්පතු ලැබීම්	86,485	46,091
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**48,482,181**	**30,065,574**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	36,874,912	23,416,413
සහනාධාර සහ මාරුකිරීම්	32,179	40,751
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	9,740,367	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	8,741	-
අත්තිකාරම් ගෙවීම්	1,638,507	644,800
තැන්පතු ගෙවීම්	86,485	46,091
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**48,381,191**	**24,148,055**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**100,990**	**5,917,519**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	100,990	5,917,519
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**100,990**	**5,917,519**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(අ)-(ඉ)	**(100,990)**	**(5,917,519)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(අ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

(මු.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)

සටහන

වියදම් ශීර්ෂ අංකය: 231 **දෙපාර්තමේන්තුවේ නම: ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

(i) **වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය**

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	නැත	නැත
රු	25,000.01	වැඩි	නැත	නැත
	එකතුව		නැත	නැත

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1	නැත	නැත
2	නැත	නැත
3	නැත	නැත
4	නැත	නැත
එකතුව	නැත	නැත

(ii) **තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය**

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	නැත	නැත
රු	25,000.01	වැඩි	නැත	නැත
	එකතුව		නැත	නැත

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1	නැත	නැත
2	නැත	නැත
3	නැත	නැත
4	නැත	නැත
එකතුව	නැත	නැත

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	නැත
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	නැත
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	නැත
	ගණන	රු

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය 2023/02/23

P.N. Vijegunara
Accountant (Acting
Department of Debt Concilia
No. 35A, Dr. N.M. Perera
Colombo 08.

සටහන-(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 231 දෙපාර්තමේන්තුවේ නම : ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය: 01 - මෙහෙයුම් වැඩසටහන්

1 වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

	අගය	සිද්ධි සංඛ්‍යාව		වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	නැත	නැත	නැත
(ii)	රු. 25,000.01 වැඩි	නැත	නැත	නැත
	එකතුව		නැත	නැත

2 වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

	අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
2	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
3	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
4	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
5	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
6	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
	එකතුව	නැත	නැත	නැත	නැත	නැත	නැත

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මූ.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2021/07/29

P.N. Vijegunaratne
Accountant (Acting.)
Department of Debt Conciliation Board
No. 35A, Dr. N.M. Perera Mawatha,
Colombo 08.

සටහන - (iii)

2022දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

දෙපාර්තමේන්තුවේ නම: ණය සහනදායක මණ්ඩලයිය දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 231
වැඩසටහන් අංකය හා නාමය: 01 - මෙහෙයුම් වැඩසටහන

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් අංකය	දිනය	ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂයය	අයිතම අංකය	මූල්‍යකරණය	බැඳීම් (රු.) (1)	බැඳීම් ශේෂය (රු.) (2)=(1)-(3)	බැරකම්වලට ඇතුළත් වූ දිනය	බැරකම් වටිනාකම (රු.) (3)	සංශෝධිත බැරකම් (රු.) (4)	බැරකම් නිදහස් කිරීම් (රු.) (5)	බැරකම් ශේෂය (රු.) (6)=(4)-(5)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු																
.....	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
.....																
එකතුව																
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල																
.....	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
.....																
එකතුව																
3. වෙනත් (පෞද්ගලික අංශය)																
.....	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත
.....																
එකතුව																
මුළු එකතුව																

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2023/02/22

P.N. Vijegunaratne
Accountant (Acting.)
Department of Debt Conciliation Board
No. 35A, Dr N.M Perera Mawatha,
Colombo 08.

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

දෙපාර්තමේන්තුවේ නම: ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 231
වැඩසටහන් අංකය හා නාමය: 01 - මෙහෙයුම් වැඩසටහන

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
නැපැල් දේපාර්තමේන්තුව	නැපැල් ගාස්තු - ගාල්ල ශාඛා මණ්ඩලය	1	0	1402	11	397,833		230
එකතුව								230
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
මහ නගරසභාව කුරුණෑගල	ජල බිල්පත - කුරුණෑගල ශාඛා මණ්ඩලය	1	0	1403	11	716,667		638
මහ නගරසභාව කුරුණෑගල	මලපහ බිල - කුරුණෑගල ශාඛා මණ්ඩලය	1	0	1409	11	1,421,667		2,500
ලංකා විදුලිබල මණ්ඩලය	විදුලි බිල්පත් ගෙවීම	1	0	1403	11	716,667		80,376
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	ජල බිල්පත	1	0	1403	11	716,667		13,059
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.ඒ.ල්.සී	දුරකතන බිල්පත්	1	0	1402	11	397,833		27,394
සිමාසහිත රක්නා ආරක්ෂක ලංකා	ආරක්ෂක සේවා	1	0	1409	11	1,421,667		216,444
එකතුව								340,412

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
3. වෙනත් (පෞද්ගලික අංශය)								
ගම්පහ හා කුරුණෑගල ශාඛා මණ්ඩලය - ලඝු ලේඛිකා පුහුණු දීමනා	ගම්පහ හා කුරුණෑගල ශාඛා මණ්ඩලයේ ලඝු ලේඛිකා පුහුණු දීමනා	1	0	1409	11	1,421,667		18,000
ප්‍රධාන ශාඛාව - ගොඩනැගිලි කුලී වෙනුවෙන් දරණ ලද වියදම	දේපාර්තමේනුතුවේ ගොඩනැගිලි කුලී	1	0	1404	11	4,805,000		600,000
ගාල්ල ශාඛා මණ්ඩලය - පවිත්‍රතා වෙනුවෙන් දරණ ලද වියදම්	ගාල්ල ශාඛා මණ්ඩලයේ පවිත්‍රතා වියදම්	1	0	1409	11	1,421,667		8,400
එකතුව								626,400
මුළු එකතුව								967,042

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023/02/23

P.N. Vijegunaratne
Accountant (Acting.)
Department of Debt Conciliation Board
No. 35A, Dr. N.M Perera Mawatha,
Colombo 08.

3.6 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

රු 000

ආදායම් සංකේතය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %ලෙස
20.02.02.99	පොලිය - අනෙකුත්	-	-	107,437.24	-
20.03.99.00	විකුණුම් සහ ගාස්තු අනෙකුත් ලැබීම්	337,600.00	337,600.00	307,054.50	90%
20.06.02.02	වෙනත්	6,000.00	6,000.00	3,600.00	60%

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කරගැනීම් කාර්ය සාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මූල්‍ය ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	39,900	39,900	36,912	92.5%
ප්‍රාග්ධන	730	730	101	13.8%

3.8 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවටම ප්‍රධානය කරන ලද ප්‍රධාන ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන යේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරගන්නා ලද ප්‍රතිපාදන ලබා අවසාන ප්‍රතිපාදනවල % ලෙස
නැත	නැත	නැත	නැත	නැත	නැත	නැත

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

වත්කම්	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදි ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ	11,012.97	11,012.97	-	100%

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/A/DDCB/FA/2022/05 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 31 දින

ලේකම්

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම් විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් නවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවධානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මග හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.2	රු.173,300 ක් වටිනා වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වර්ෂයේ එකතු කිරීම් යටතේ දක්වා නොතිබීම.	1.6.2 (ආ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

(අ) වැටුප් චේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ භාණ්ඩාගාර මුද්‍රිත SA 10 අනුව රු.21,423,491 ක් වුව ද, රු.21,642,644 ක් ලෙස රු.219,153 ක් වැඩියෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි හා ACA – 2 (ii) ආකෘතියෙහි දක්වා තිබුණි.

(ආ) අනෙකුත් භාණ්ඩ හා සේවා වටිනාකම් භාණ්ඩාගාර මුද්‍රිත SA 10 අනුව රු.15,456,221 ක් වුව ද, රු.15,237,069 ක් ලෙස රු.219,152 ක් අඩුවෙන් ACA – 2 (ii) ආකෘතියෙහි හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) භාණ්ඩාගාර මුද්‍රිත SA 82 අනුව කාර්යාල උපකරණ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.517,818 ක් වුව ද, රු.677,581 ක් ලෙස රු.159,763 ක් වැඩියෙන් 2022 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙනවිත් තිබුණි. එමෙන්ම පරිගණක උපකරණ හා ලී බඩු පිළිවෙලින් රු.138,000 ක් හා රු.21,763 ක් අඩුවෙන් ශේෂ ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.173,300 ක් වූ මූල්‍ය නොවන වත්කම් සමාලෝචිත වර්ෂයේ දී ද ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි 8.2 අනුව කවදුරටත් වාර්තා කල යුතු මූල්‍ය නොවන වත්කම් තිබේ නම්, ඒවා නිසි පරිදි හඳුනා ගෙන පිරිවැයට හෝ පිරිවැයට හඳුනාගත නොහැකි අවස්ථාවල තක්සේරු කළ අගයට ගිණුම් ගත කළ යුතු වුව ද, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් 2022 නොවැම්බර් 24 දින නිකුත් කරන ලද භාණ්ඩ අයිතම 14 ක් සඳහා ලැබීම් නියෝග නිකුත් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල එකතු කිරීම් යටතේ දක්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 **වියදම් කළමනාකරණය**

අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 9 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක එකතුව රු.2,842,145 ක් ඉතිරි වී තිබුණු අතර එය සියයට 6 සිට සියයට 100 ක පරාසයක් දක්වා විහිදී තිබුණි.

2.2 **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

භාණ්ඩාගාර ප්‍රකාශ අනුව රු.967,042 ක් බැරකම් වාර්තා නොවූවද, ගිණුම් සටහන (iv) හි බැරකම් පිළිබඳ ප්‍රකාශයේ රු.967,042 ක් බැරකම් දක්වා තිබුණි.

2.3 **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථානයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.3 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 අතිවිශේෂ ගැසට් නිවේදනය	රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුවත්, අවස්ථා 27 ක දී රු. 2,008,371 ක් වූ ගෙවීම් වෙනුවෙන් මුද්දර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (5)	අවස්ථා දෙකක දී ලබා දී තිබූ රු. 200,000 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම පියවීමේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 7 වන ඡේදය	චක්‍රලේඛය පරිදි නිලධාරීන් 14 දෙනෙකුගෙන් වැටුප්පත්‍ර සඳහා අත්සන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඈ) 1941 අංක 39 දරන ණය සහනදායක මණ්ඩල ආඥා පනතේ 2 හා 3 (2) ඡේද	ණය සහනදායක මණ්ඩලයේ සාමාජික මණ්ඩල සභාපති හා සාමාජිකයින් 04 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එහි සන පූර්ණය සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත යුතු වුව ද, සන පූර්ණය සම්පූර්ණ නොවී තිබියදී නඩු විසඳීමේ කටයුතු සිදුකර තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

දැක්මේ සඳහන් පරිදි නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ ණය ගනුදෙනුවලින් පීඩාවට පත් වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායී වැඩපිළිවෙලක් සලසා දීමට ප්‍රමාණවත් ක්‍රියාකාරකම් හඳුනා ගෙන නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දී ණයගැනි භාවයෙන් පෙලෙන ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 05 ක් පමණක් ජනවාරි මාසයේ දී උතුරු පළාත ඉලක්ක කරගෙන සිදුකර තිබුණු අතර වෙනත් කිසිදු ප්‍රදේශයක ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.2 ක්‍රියාකාරී සැලැස්ම

(අ) 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව 2022 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ආ නඩු සංඛ්‍යාවල වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තු වාර්තාවලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට තිබිය යුතු නඩු ගොනු ප්‍රමාණය හා භෞතිකව දෙපාර්තමේන්තුව සතු නඩු ගොනු ප්‍රමාණය අතර වෙනසක් පැවති අතර ඒ අනුව ප්‍රධාන ශාඛාවේ නඩු ගොනු 836 ක හා ගම්පහ ශාඛාවේ නඩු ගොනු 03 ක ඌණතාවයක් ද, ගාල්ල ශාඛාවේ නඩු ගොනු 59 ක අතිරික්තයක් ද නිරීක්ෂණය විය.

3.1.3 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තා මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2020 හා 2021 වර්ෂයන්ට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2023 අප්‍රේල් 19 වන දින ය.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ගිණුම් සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

2021 හා 2022 වර්ෂවල ප්‍රසම්පාදන සැලසුම් තුළ ශාඛාවන් සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම සැලසුම් කර නොතිබුණි.

3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද, රජයේ ගිණුමට අදාළ වවුචර, සහතික කරන, චෙක්පත් අත්සන් කරන අය ද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 04 දෙනෙකු ඇප තබා නොතිබුණි.

3.4 පාඩු හා හානි

(අ) 2022 ජනවාරි 11 දින WPKP 1251 දරන මෝටර් රථය සඳහා වූ අනතුරට අදාළ රු.101,800 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශයෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104 (3) අනුව ප්‍රාරම්භක වාර්තාවක් වහාම ඉදිරිපත් කළ යුතු වුව ද, ඉහත අනතුරට අදාළ මුදල් රෙගුලාසි 104 (3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කර තිබුණේ 2023 පෙබරවාරි 21 දින වන අතර මුදල් රෙගුලාසි 104 (4) යටතේ අලාභයන් පිළිබඳව අවසාන වාර්තාව 2023 මාර්තු 10 දින ඉදිරිපත් කර තිබුණි.

(ඇ) වාහන අලුත්වැඩියාවන්වල දී අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනවලින් අලුත්වැඩියාවන් සිදුකර තිබුණු අතර, එම අලුත්වැඩියාවන් සඳහා රජයේ කාර්මික නිලධාරියෙකුගේ නිර්දේශය ලබාගෙන නොතිබුණි.

4. තිරසර සංවර්ධනය

2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපායමාර්ග කළමනාකරණ සැලැස්මට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමින් ලගාකර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම් කර තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයට යොමු කර තිබුණේ 2023 අප්‍රේල් 17 වන දින ය.

5. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ මට්ටම	02	01	01
ද්විතියික මට්ටම	26	31	(05)
ප්‍රාථමික මට්ටම	06	05	01
	34	37	(03)

(i) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 01 ක්, ද්විතීක මට්ටමේ අතිරික්ත 05 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 01 ක් වශයෙන් තථ්‍ය කාර්ය මණ්ඩලය පැවතුණි.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදුකළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුව ද, 2021 මාර්තු 17 දින සිට පුරප්පාඩුව පවතින ගණකාධිකාරී තනතුරට විගණිත දින වන විටත් නිත්‍ය පත්වීමක් සිදුකර නොතිබුණි.

(iii) ද්විතීක මට්ටම තුළ ඇතුළත් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 05 ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 19 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 14 ක් වී තිබුණි.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 වන පරිච්ඡේදය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශන	අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
කාර්ය මණ්ඩල අභිප්‍රේරණය	-	75%	-
දෙපාර්තමේන්තුවේ සේවාව සැපයීම හා ලබන ප්‍රචාරණය	-	-	70%
දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවයෙහි ඵලදායිතාවය	90%	85%	-

05 වන පරිච්ඡේදය

තිරසාර සංවර්ධනය අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0% - 49%	50% -74%	75%-100%
නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ උකස්කාර පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගණුදෙනුව සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු හා අනෙකුත් බැඳීම් කෙරෙහි වූ අයවිය යුතු ණය ව සම්මුති වලට පාර්ශවයන් පැමිණවීම	ණය සහනදායක මණ්ඩලය විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාව පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම	ණය සහනදායක මණ්ඩලය ශාඛා ගම්පහ, කුරුණෑගල හා ගාල්ල දිස්ත්‍රික් කේන්ද්‍ර කර ගනිමින් පිහිටුවීම හා කොළඹ දිස්ත්‍රික්කයේද නව ශාඛා මණ්ඩලයක් පිහිටුවීම.			85%

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ණය සහනදායක මණ්ඩලයේ ශාඛා මණ්ඩල ගම්පහ, ගාල්ල සහ කොළඹ යන දිස්ත්‍රික් කේන්ද්‍ර කරගනිමින් පිහිටුවා පවත්වාගෙන යනු ලැබේ.

06 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	01	01	-
තෘතියික	01	01 (වැඩ)	-
ද්විතියික	26	25(06 අනුයුක්ත)	ඇබෑර්තු - 15 අතිරික්ත - 11
ප්‍රාථමික	06	04	02

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දෙපාර්තමේන්තුවේ සේවාව කාර්යක්ෂමව හා ඵලදායිව මහජනතාව වෙත ලබා දීමට දෙපාර්තමේන්තුව තුළ පවතින සේවක පුරප්පාඩු බෙහෙවින් බලපෑම් සිදුකරනු ලබයි.

මෙම ණය සහනදායි මණ්ඩලීය දෙපාර්තමේන්තුව තුළ ප්‍රාථමික උසාවියක් ක්‍රියාත්මක බැවින් ඒ සඳහා අත්‍යවශ්‍යම මානව සම්පතක් වන ලඝුලේඛක සේවකයින් 03 දෙනෙක්, දෙපාර්තමේන්තුව සඳහා අනුමත අතර එම තනතුරු 03 ම පුරප්පාඩු ලෙස වසර කිහිපයක සිට පවතින අතර ශාඛා මණ්ඩල තුන සඳහාද ලඝුලේඛක සේවකයින් 03 දෙනෙක් අනුමත කර ඇති මුත් අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් අනුයුක්ත කරන ලද සේවිකාවන් පමණක් දෙපාර්තමේන්තුව තුළ හා ශාඛා මණ්ඩල තුල සේවය කරන ලදි. දිනකට ණය සහනදායක මණ්ඩලය විසින් නඩු 50ක් පමණ විමසීමට ගනු ලබන අතර, නඩු ගොනුවලට අදාළ පාර්ශවයන්ට පිටපත් නිකුත් කිරීමේදි සිදු වන ප්‍රමාදයන්ට දෙපාර්තමේන්තුවේ ලඝු ලේඛන තනතුරුවල පැවති පැවති පුරපපාඩුව බෙහෙවින් බලපෑම් කරන ලදි.

දෙපාර්තමේන්තුව තුළ පවතින විෂයන් ආවරණය වීම ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති වීමෙන් එක් සේවකයෙකු සඳහා විෂයන් කිහිපයක් ආවරණය කිරීමට සිදුවීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ සේවය කාර්යක්ෂමව සැපයීමට බාධා සිදුවිය. තවද, ඒ ඒ විෂය පථයන්ට අදාළව දැනුම හා කුසලතාව වර්ධනය කිරීමට උපකාරී වන පුහුණු වැඩසටහන් සඳහා වෙනත් වර්ෂයන්ට සාපේක්ෂව වෙන් කර තිබූ ප්‍රතිපාධන අවම මට්ටමක පැවතීම හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුවේ සේවක සේවිකාවන් යොමුකිරීමට නොහැකි වූ අතර, කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටි නිලධාරීන් සඳහා අවශ්‍ය දැනුම ලබා දීමට අදාලව පන්ති පවත්වන ලදී.

07 වන පරිච්ඡේදය
අනුකූල වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතාවය තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූලතා නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේ වළක්වාගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරකම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ.		
1.6	වෙනත්	අනුකූල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල කාඩ්පත්	අනුකූල වේ		

	යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	මෙම දෙපාර්මේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොපවතී. අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කරනු ලබයි.	
2.5	සියළුම මාසික ගිණුම් සාරංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA- N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදි ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.	.	
4	**වාර්ෂික සැලැසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොතිබු අතර	

			අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහන ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුමවලට පිළිතුරු දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134 (2) DMA/1 2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොතිබූ අතර අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොතිබූ අතර	

	අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.		අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු කරනු ලබයි.	
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිකරවරයාට ඉදිරිපත් කිරීම.	අනුකූල නොවේ.	මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොතිබු අතර අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදි ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ.	2019 හා 2020 වර්ෂයේ වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කර නැත.	2019 හා 2020 වර්ෂයේ වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන	අනුකූල වේ		

	ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණ සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා සකස් කොට නියමිත විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්හීත වී මාස 06 කට වඩා අඩු කාලයකදි අපහරණය කර තිබීම	අනුකූල නොවේ		

9.3	වාහන ලෝග් පොත පවත්වාගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රෙ 103, 104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම, නැවත පරික්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්යෙන්ම අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ	අනුකූල වේ.		

	සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ 94 (1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වල පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල නොවේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය සිදු කර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			

14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			

16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවතාවගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.	දෙපාර්තමේන්තුව සඳහා වෙබ් අඩවියක් නොමැති අතර අධිකරණ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ මෙම දෙපාර්තමේන්තුව පිළිබඳ තොරතුරු සඳහන් වේ.	
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/ 2008 හා 05/ 2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/	අනුකූල වේ.		

	සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.			
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සම්පාදනය**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම	අනුකූල වේ		

	පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.			
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.		